**ශීර්ෂය 265- මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 19 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික පනතේ 6 (I) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා වැය කළ එකතුව රු. 7,226,394 ක් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ලෙස නොදැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි කාලයේ මෙවැනි දෝෂ සිදු නොවීමට අදාල නිලධාරීට උපදෙස් ලබාදී ඇත. | වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතු වේ. |
| (ii) | වර්ග අඩි 2625ක වපසරියකින් යුතු මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටි ඉඩමේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වත්කම් සඳහා තක්සේරු වාර්තා ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 2.1 බැඳීම් සහ බැරකම්වලට එළැඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2019 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයේ ඉටු කරන ලද බැරකම් එකතුව රු.98,566,889ක මූල්‍ය ප්‍රතිපාදන ලැබී නොමැති වීම හේතුවෙන් පසුගිය වර්ෂ 01 සිට 03 දක්වා කාලයක් ගෙවීම් සිදුනොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | බැරකම් වශයෙන් පැවැතුණි. | ප්‍රතිපාදන සලසාගෙන අතැති බිල්පත්වලට ගෙවීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| | **2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | | |
| (අ) | 4.2.1 හා 4.2.3 මාර්ගෝපදේශ | 44,149,676 | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂය සඳහා ප්‍රසම්පාදන කාලසටහන සහ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම ආදිය සකස් කර නොතිබුණි. | ඉදිරියේදී සකස් කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව සකස් කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | 5.4.8 මාර්ගෝපදේශය | 2,634,846 | කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ක කාර්ය සාධන බැඳුම්කරයක් ඉසින වාරි උපකරණ මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබා ගත යුතුව තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතුව රු.1,317,423 ක් හෙවත් සියයට 5 ක් ලබාගෙන තිබුණි. | දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතියට අනුව සියයට 5ක් ලබාගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

## 2.3 අත්තිකාරම් ලබාදීම් හා නිරවුල් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය අත්හිටවූ සහ සේවය හැර ගිය සේවකයින් 05කගේ සේවක ණය හිඟ ශේෂ එකතුව රු. 623,250ක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට පියවර ගෙන ඇත. | හිඟ ණය අයකර ගැනීමට සුදුසු පියවර ගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකි වීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනතාවට පිරිපහදු ජලය ලබාදීම සඳහා පැයකට ලීටර් 750ක ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍රයක් සහ කාමරයක් ඉදිකිරීම සඳහා රු. මිලියන 3.28ක් ගෙවීම් කර මිලදී ගතයුතු වුවත්, පැයකට ලීටර් 500ක ජල පිරිපහදු යන්ත්‍රයක් මිලදී ගෙන ලබාදීම හේතුවෙන් එම ගමේ ජනතාවට දිනකට අවශ්‍ය පිරිපහදු කළ ජල ප්‍රමාණය ලබා ගැනීමට නොහැකි වි තිබුණි. | සුදුසු පිළිතුර ලබාදී නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 අනුව නියමිත පිරිවිතරයන්ට අනුව මිලදී ගත යුතු ය. |

### 3.2 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.26,348,460කට මිලදීගත් ප්‍රතිලාභීන්ගේ ඉසින වාරි ව්‍යාපෘති 80ක් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසු මිල ගණන් ලැයිස්තු සම්පූර්ණ නොකිරීම ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය සඳහන් කර නොතිබීම, බලයලත් නිෂ්පාදකයන් සඳහන් කර නොතිබීම සහ තාක්ෂණික ඇගැයීම් කමිටු සාරාංශ වාර්තාවකින් තොරව ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි. | සැපයුම්කරුවන් සහ අනෙකුත් අය නියමිත ලංසු මිලගණන් ආකෘති පත්‍ර සම්පූර්ණ කර නොතිබුණි. එසේ වුවත්, සැපයුම්කරුවන් වෙනත් ලැයිස්තුවක සඳහන් කර ලබාදී තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ප්‍රසම්පාදන අත්පොත ප්‍රකාරව ක්‍රියාත්මක කළ යුතුය |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පවතින යතුරු පැදි 14ක්, රෝද දෙකේ ට්‍රැක්ටරයක්, ට්‍රැක්ටර් ට්‍රේලරයක් සහ තවත් වාහන 03ක් අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අදාල වාහනවල ලියාපදිංචි පොත් නොමැතිවීම හේතුවෙන් මෝටර් රථ කොමසාරිස්වරයාගෙන් වැඩිදුර උපදෙස් ලබාගැනීමට තීරණය කර ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.4 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිකරමින් පවතින තාක්ෂණික උද්‍යානය, වාහන නැවැතුම් පළ සහ රැස්වීම් ශාලාව ආදිය සඳහා මෙම වාර්තාවේ දිනය වන විට රු.72,565,061ක් ගෙවා තිබූ නමුත් නාගරික සංවර්ධන අධිකාරියේ පනත්වලට අනුකූලව අනුමැතිය ලබා ගැනීමට හෝ ගොඩනැගිලි සැලැසුම් ව්‍යුහය සකස් කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි. | ඉදිරි කාලවලදි මෙවැනි දෝෂ වලක්වා ගනු ලැබේ. | ඉදිකිරීම් කාර්යයන් සම්බන්ධයෙන් මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කළ යුතු අතර අදාල අනුමැතීන් ලබාගැනීමට පියවර ගතයුතු වේ. |

### 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුමත කළ කාර්ය මණ්ඩලය 667ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේ ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියික හා ප්‍රාථමික මට්ටම්වල, කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 172ක් පැවැතුණි. මේ හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මහජනතාවට සිදුකරන සේවාවන්හි කාර්යසාධක දර්ශකයන් වන වෙළෙඳ බලපත්‍ර සහතික නිකුත් කිරීම් හා ඉඩම් අනුමැතිය ලබාදීම වැනි මෙහෙයුම් අඩාල වී තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. | අවශ්‍යතාවට අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු සිදුකළ යුතුය. |